# මතුගම අධ්‍යාපන කලාපය

## විද්‍යා විෂය ඒකක සංවර්ධන වැඩසටහන

| 9 ශ්‍රේණිය | සනත්වය | ඒකකය - 11 |
|---|---|---|





(01). පහත ද්‍රව වර්ගවලින් සනත්වයෙන් වැඩිම ද්‍රවය කුමක් ද?

1. ජලය 2. රසදිය 3. භූමිතෙල් 4. මුහුදු ජලය


(02). සනත්වය මනිනු ලබන අන්තර්ජාතික සම්මත ඒකකය කුමක් ද?

1. $Kgm^{-3}$ 2. $Kgcm^{-3}$ 3. $gcm^{-3}$ 4. $gml^{-1}$


(03). රූපසටහනට අනුව සනත්වයෙන් අඩුම ද්‍රවය ඇති බඳුන කුමක් ද?

1.

2.

3.

4.


(04). සර්වසම භාජන 4 කට P Q R S ද්‍රව වර්ග 4 කින් සමාන ස්කන්ධ බැගින් දමා ඇත. සනත්වය අඩුම ද්‍රව්‍ය යොදා ඇති බඳුන තෝරන්න.

1.

2.

3.

4.


(05). විවිධ දියර වර්ගවල සනත්වය මැනීමට යොදා ගන්නා උපකරණය කුමක් ද?

1. වෘද්ධිමානය 2. කෝණමානය 3. ද්‍රවමානය 4. උෂ්ණත්වමානය

(06). යම් ද්‍රව්‍යයක සනත්වය ගණනය කර ගැනීමට ලබා ගත යුතු මිනුම් වන්නේ,

1. වස්තුවේ බර හා ස්කන්ධය
2. වස්තුවේ බර හා පරිමාව
3. වස්තුවේ ස්කන්ධය පරිමාව
4. ඉහත කිසිවක් නිවැරදි නැත.

(07). ජලය, පෙට්‍රල් හා රසදිය ඒවායේ සනත්ව ආරෝහණය වන පිළිවෙලට ලියා ඇති පිළිතුර තෝරන්න.

1. රසදිය, පෙට්‍රල්, ජලය
2. ජලය, පෙට්‍රල්, රසදිය
3. රසදිය, ජලය, පෙට්‍රල්
4. පෙට්‍රල්, ජලය, රසදිය

(08). සරල ද්‍රවමානයක් සාදා ගැනීමට පහසුම උපකරණ සඳහන් පිළිතුර කුමක් ද?

1. වීදුරු පුනීලයක්, ප්ලාස්ටික් බෝතලයක් හා ජලය
2. පැන් බටයක්, පාටකළ ජලය හා කුප්පිය
3. බීම බටයක්, කුඩා යකඩ බෝල හා ඉටිපන්දම
4. පොලිතීන් පටලය, පාට කළ ජලය හා ඉටිපන්දම

(09). යම් ද්‍රව්‍යයක ඒකක පරිමාවක ස්කන්ධය යනු එම ද්‍රව්‍යයේ,


1. සනත්වය යි 2. පරිමිතිය යි 3. පීඩනය යි 4. වර්ගඵලය යි

(10). මල මුහුද අනෙක් ජලාශවලට වඩා වෙනස් වන්නේ,

1. එහි ක්ෂුද්‍ර ජීවීන් බහුලව ජීවත්වන නිසා
2. එහි මැරුණු ජීවීන් බහුල නිසා
3. එහි ලවණ සාන්ද්‍රණය ඉතා ඉහළ නිසා
4. එහි යන සෑම කෙනෙක්ම ගිලී මැරෙන නිසා

## B කොටස - රචනා

01. සමාන බඳුන් තුනකට එකිනෙක මිශ්‍ර නොවන ද්‍රව වර්ග 3 කින් සමාන පරිමා බැගින් දමා ඇත.



X Y Z

i. ඝනත්වය මැනීමට මිනුම් උපකරණ භාවිතා නොකර මෙම ද්‍රව ඒවායේ ඝනත්ව වැඩිවන පිළිවෙලට පෙළ ගන්වා ලියන්න. (ල. 02)

ii. ද්‍රවවල ඝනත්ව මනින උපකරණය කුමක් ද? (ල. 02)

iii. බීම බටයක්, ඉටි පන්දමක් හා හලා ගත් වැලි භාවිතා කර එවැනි උපකරණයක් සාදා ගන්නේ කෙසේදැයි ලියන්න. (ල. 02)

iv. උසින් වැඩි බඳුන් දෙකකින් එකක භූමිතෙල් ද අනෙක් බඳුනෙහි ලුණු වතුර ද පුරවා ඇත්නම් වන පියවරේ දී ඔබ සෑදූ උපකරණය එම බඳුන් තුළ ඇති ද්‍රවයේ පාවෙන ආකාරය අඳින්න. (ල. 02)

The National e-learning portal for The General Education

02. i. ජලය 4000 kg ක ස්කන්ධයක පරිමා 4 $m^3$ කි. එම ජලයේ ඝනත්වය සොයන්න. (ල. 03)

ii. කිසියම් ද්‍රාවණයක ඝනත්වය 800 $Kgm^{-3}$ වන විට එම ද්‍රාවණයෙන් 200 Kg ක් කිරා ගත්විට එම පරිමාව කොපමණ වේ ද? (ල. 03)

iii. ජලයේ පරිමාව මැනීමට විද්‍යාගාරක් තුළ දී භාවිතා කරන උපකරණය කුමක් ද? (ල. 02)

iv. ද්‍රවවල ඝනත්ව මැනීමට විද්‍යාගාරයේ භාවිතා කරන උපකරණය කුමක් ද? (ල. 02)

03. පහත සඳහන් ද්‍රවමාන භාවිතා කෙරෙන අවස්ථාවන් මොනවා ද?

i. ක්ෂීරමානය
ii. පාංශු ද්‍රවමානය
iii. මෙට්‍රොලැක් උපකරණය
iv. කරදිය ද්‍රවමානය (ල. 2×5=10)

04. වරහන් තුළ ඇති වචන යොදා හිස්තැන් පුරවන්න.

(වීදුරු, ඝනත්වය, පරිමාව, ද්‍රවමාන, ස්කන්ධය)

සංශුද්ධ ද්‍රවවල ............................. නියත අගයක් ගනී. .................................. භාවිතයෙන් විවිධ ද්‍රව වර්ගවල ඝනත්ව මැන ගත හැක. ඝන වස්තූන්ගේ ඝනත්වය මැනීමට එහි ............................... හා ........................... දැන සිටිය යුතු ය. විද්‍යාගාර ද්‍රවමාන ඇතුලත දර්ශකය වන සේ ...........................වලින් නිපදවා ඇත. (ල. 2×5=10)